CHIEF JUSTICE'S CHAMBERS,
SUPREME COURT,
COLOMBO 12,
SRI LANKA.
FAX : ++94 (0) 11 2437534
TELE. : ++94 (0) 11 2422142
E-mail : scjlib@sltnet.lk

අග්‍රවිනිශ්චයකාර නිලමැදිරිය,
ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12,
ශ්‍රී ලංකාව.
ෆැක්ස් : ++94 (0) 11 2437534
දුරකථනය : ++94 (0) 11 2422142

DLS.
F.W.a.p.l.
08/07/24

ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය,
අග්‍රවිනිශ්චයකාර,
අග්‍රවිනිශ්චයකාර නිල මැදිරිය,
ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12.
2024.06.26

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ගරු කථානායකතුමණි,

ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් 2024 ජූනි මස 19 වන දින පාර්ලිමේන්තුව තුළදී සිදු කල ප්‍රකාශයක් අතරතුරදී සභාගත කරන ලද ලේඛන කිහිපයක් ගරු කථානායකතුමාගේ කාර්යාලය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබ, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එකී ලේඛන මා වෙත 2024 ජූනි මස 24 වන දින යොමු කරන ලදී. ඉනික්බිතිව 2024 ජූනි මස 25 වන දින ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් බරපතල ලෙස වරප්‍රසාද, පරිහාර සහ බලතල උල්ලංඝනය කිරීම පිළිබඳව වන පැමිණිල්ලයි" යන ශීර්ෂපාඨයෙන් යුතුව ගරු කථානායකතුමා වෙත යොමු කරන ලද ලිපියක පිටපතක් මා වෙතද යොමු කර ඇත.

මා ඉහතින් සඳහන් කරන ලද පාර්ලිමේන්තුව තුල සභාගත කරන ලද ලේඛන පිළිබඳව මා සභාපතිත්වය දරමින් තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන් දෙපලකගේ සාමාජිකත්වයෙන් යුතුව කටයුතු කරන අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට යොමු වූ අතර, එකී ලේඛනයන්හි අන්තර්ගතයන් සහ එකී ලේඛන සම්බන්ධව ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් 2024 ජූනි මස 19 වන දින කල කරුණු දැක්වීම්හි මහාධිකරණ විනිසුරුවරයකු වන අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ක්‍රියාකලාපයද දෝෂදර්ශනයට ලක් කරමින් කරුණු ඉදිරිපත් කර ඇත.

එසේ හෙයින් එකී කාරණා සම්බන්ධව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මේ වන විට ගෙන ඇති පියවරයන් සහ ඒවායේ වර්තමාන තත්වය පිළිබඳව වූ සංක්ෂිප්ත වාර්තාව උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කරමි.



CamScanner

CHIEF JUSTICE S CHAMBERS,
SUPREME COURT.
COLOMBO 12.
SRI LANKA.
FAX : ++94 (0) 11 2437534
TELE. : ++94 (0) 11 2422142
e-mail : scjlib@sltnet.lk

අග්‍රවිනිශ්චයකාර නිලමැදිරිය,
ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12,
ශ්‍රී ලංකාව.
ෆැක්ස් : ++94 (0) 11 2437534
දුරකථනය : ++94 (0) 11 2422142

ගරු අධිකරණ අමාත්‍යතුමාගේ ඉහත සඳහන් ප්‍රකාශයට පාර්ලිමේන්තුවේ සජීව විකාශනය මගින් සහ අනිකුත් විද්‍යුත් සහ ලිඛිත මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලද අතර, එවැනිම ප්‍රචාරයක් තුලින් පාර්ලිමේන්තුව තුල මහජනතාව නියෝජනය කරමින් සිටින්නා වූ සියලුම මන්ත්‍රීවරුන් සහ පොදු මහජනතාව දැනුවත් වන ප්‍රචාරයක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉහත කී සංක්ෂිප්ත වාර්තාවටද ලබාදීම යුක්තිය හා සාධාරණත්වය අනුව අත්‍යාවශ්‍ය වන්නා වූ කාරණයක් බව ඔබතුමාගේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි. තවද එය සභාගත කර හැන්සාඩ් ගත කිරීමටද පියවර ගන්නේ නම් මැනවි.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් "2024.06.24 දින නිකුත් කරන ලද මාධ්‍ය ප්‍රකාශය සම්බන්ධවයි" යන ශීර්ෂය යටතේ මා වෙත යොමු කොට ඇති 2024.06.24 ලිපියේ සඳහන් කාරණය පිළිබඳවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ගරු අමාත්‍යතුමා 2024 ජුනි 25 දිනැතිව යොමු කරන ලද ලිපියෙහි දක්වා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැනට පවත්නා නඩු කටයුත්තකදී ප්‍රකාශ කරන ලද අතුරු නියෝගයක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වී ඇති අතර, එකී අතුරු නියෝගය දෝෂ දර්ශණයට ලක් කිරීමක් සිදු කර ඇත.

වර්තමානයෙහි උපරිමාධිකරණයන්හි විනිශ්චයකාරවරුන් හත් දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතරම ඉන් පුරප්පාඩු දෙකක් ශ්‍රේෂ්ඨාධිකරණයේද, පුරප්පාඩු පහක් අභියාචනාධිකරණයේද පවතී. ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක පිළිවෙලින් 2023 නොවැම්බර් මස 15 වෙනි දින සහ 2024 මාර්තු මස 01 වන දින ඇති වූ අතර, 2023 නොවැම්බර් මස 15 වෙනි දින ඇති වූ පුරප්පාඩුව පිරවීම පිළිබඳව ඇති වූ තත්වය හමුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුත්තක් ආරම්භව ඇත. එකී නඩු කටයුත්තට අදාල අතුරු නියෝගය 2024.04.30 දින නිකුත් කර ඇති අතර, එදින තෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ වූ අනෙකුත් පුරප්පාඩුව පිරවීම සඳහා කිසිදු නෛතික බාධාවක් හෝ අපහසුතාවයක් නොතිබුනි. තවද මේ වන විටත් 2023 සැප්තැම්බර් මාසයේ සිට 2024 මැයි මස දක්වා අභියාචනාධිකරණයෙහි ඇති වූ පුරප්පාඩු පිරවීම පිණිස මහාධිකරණ විනිසුරුවරුන් පස් දෙනෙකුගේ නම් නිර්දේශ කර ඇති අතර, එකී කිසිම පුරප්පාඩුවක් මේ වන තෙක් නොපිරවීම හේතුවෙන් එකී මහාධිකරණ විනිසුරුතුමන්ලා ඇතුලු අනෙකුත් විනිශ්චයකාරතුමන්ලාටද හිමි උසස්වීම් නිසි කලට ලැබීමේ අවස්ථාව අහිමි වී ඇත. අභියාචනාධිකරණයේ ඇති වි ඇති එකී පුරප්පාඩු පිරවීම සඳහා කිසිදු නෛතික බාධාවක් නොපවතින අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ අදාල අතුරු නියෝගයේද අභියාචනාධිකරණයේ පුරප්පාඩු පිරවීම පිළිබඳව කිසිදු නියෝගයක් ඇතුලත්ව නැත. තවද ගරු අමාත්‍යතුමාගේ ප්‍රකාශය තුලදී ගරු අමාත්‍යතුමාද පාර්ශවකරුවකු වන්නා වූ කොළඹ දිසා අධිකරණයේ පවත්නා නඩු කටයුත්තකදී ලබා දුන් නියෝග සම්බන්ධයෙන් ගරු කොළඹ දිසා විනිසුරුතුමා නම් කරමින් දෝෂ දර්ශනයට ලක්වීමක් සිදු වී ඇත. මෙම ජේදයේ මීට

CHIEF JUSTICE'S CHAMBERS,
SUPREME COURT,
COLOMBO 12,
SRI LANKA.

FAX : +94 (0) 11 2437534
TELE. : +94 (0) 11 2422142
e-mail : scjlib@sltnet.lk

අග්‍රවිනිශ්චයකාර නිලමැදිරිය
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12
ශ්‍රී ලංකාව

ෆැක්ස් : +94 (0) 11 2437534
දුරකථනය : +94 (0) 11 2422142

ඉහතින් සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩු කටයුත්ත ද, කොළඹ දිසා අධිකරණයේ පවතින නඩු කටයුතුද යන පවතින නඩු කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුල සිදු කරනු ලබන ප්‍රකාශයන්ට අදාල වන්නා වූ 91(ඊ) ස්ථාවර නියෝගය ඔබතුමන්ගේ අවධානයට ලක් කරනු කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනතාවගේ අධිකරණ බලය පාර්ලිමේන්තුව විසින් අධිකරණය හරහා භාවිතා කරනු ලබන අතර, පාර්ලිමේන්තුව විසින් සෘජුවම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පරිහාර හා බලතල සම්බන්ධයෙන් පමණක් කටයුතු කිරීමට සීමා කර ඇත. අනෙකුත් සියලුම කාරණා පිළිබඳව මහජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවීම ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන වෙත පවරා දී ඇත. මහජනතාවගේ එකී අධිකරණ බලය නිසිලෙස ක්‍රියාත්මක කිරීම පිණිස අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට සහතික කොට කටයුතු කිරීම සියලුම අංශයන්හි වගකීම සහ කාර්යභාරය වේ.

"අධිකරණයේ ස්වාධීනත්වය" ශ්‍රී ලංකාවාසී ජනතාවගේ මතු පරම්පරාවලද සකල ලෝකවාසීන්ගේද අභිමානය සහ සමෘද්ධිය සහතික කරන අස්පර්ශනීය උරුමයක් ලෙස පිළිගෙන එය සකල ජනතාවට සහතික කරන්නා වූත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා ගෞරවබහුමානයෙන් අධිෂ්ඨානය කරන ලද බවටද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිතව දක්වා ඇත. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරවන්නා වූ පාර්ලිමේන්තුව මෙන්ම ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවන්නා වූ අධිකරණයේද කටයුතු ව්‍යවස්ථානුකූලව නිසි ලෙස කරගෙන යාමට නිසි ඉඩ ප්‍රස්ථාවන් සලසාදීම සෑම අංශයකම වගකීම වන අතරම, එකී ආයතනයන්හි කටයුතු එකිනෙකා කෙරෙහි දක්වන්නා වූ නිසි ගෞරවයකින් යුක්තව සංයමයෙන් සිදු කිරීම පොදු මහජනතාවගේ සුභසිද්ධිය මෙන්ම නීතියෙහි ආධිපත්‍යය සුරකීම සඳහා අත්‍යාවශ්‍ය අංගයක් බවට මාගේ මතය වන අතර, එය උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායක ධූරය හොබවන්නා වූ ඔබතුමාගේ ගෞරවනීය අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ අග්‍රවිනිශ්චයකාර.



CS CamScanner

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
நீதிச்சேவை ஆணைக்குழுச் செயலகம்
**Judicial Service Commission Secretariat**

මගේ අංකය
எனது இலக்கம்
My No.

ඔබේ අංකය
உமது இலக்கம்
Your No.

දිනය
திகதி
Date

ගරු කථානායකතුමනි,

**<u>2024.06.19 දින ගරු අධිකරණ ඇමතිතුමා විසින් පාර්ලිමේන්තුවේදී අධිකරණ කටයුතු සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකලාපය පිළිබඳව සිදු කරන ලද ප්‍රකාශය හා සබැඳි අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ</u>**

යොමුව: (අ) ශීර්ෂගත කරුණු සබැඳිව ගරු අධිකරණ ඇමතිතුමා විසින් 2024.06.19 වන දින පාර්ලිමේන්තුවේදී සිදු කරන ලද ප්‍රකාශය.

(ආ) අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් ගරු අග්‍රවිනිශ්චයකාරතුමා අමතා ඇති අංක MOJ/P/MCCM/05 සහ 2024.06.24 දිනැති ලිපිය සමඟ එවා ඇති යොමුව (අ) දරණ ප්‍රකාශය සිදු කරමින් ගරු අධිකරණ ඇමතිතුමා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තා.

(ඇ) ගරු අග්‍රවිනිශ්චයකාරතුමාට පිටපතක් සහිතව ගරු අධිකරණ ඇමතිතුමා විසින් සිය පාර්ලිමේන්තු වරප්‍රසාද, පරිහාර සහ බලතල උල්ලංඝනය කල බවට ඉදිරිපත් කර ඇති 2024.06.25 දිනැති පැමිණිල්ල.

යොමුගත (අ), (ආ) සහ (ඇ) දරණ ප්‍රකාශය, සභාගත කරන ලද වාර්තා සහ 2024.06.25 දිනැති පැමිණිල්ල මඟින් ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති කරුණු සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ පහත පරිදි ඔබතුමා වෙත ඉදිරිපත් කරමි.

(I) ගල්කිස්ස දිසා විනිසුරු නිල නිවසට ගල්කිස්ස අධිකරණ සංකීර්ණයෙන් අනවසරයෙන් විදුලිය සහ ජලය ලබා ගැනීම.

නිරීක්ෂණ: ශීර්ෂගත කරුණ සබැඳිව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත 2024.05.08 දින ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් මත අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ඒ හා සබැඳිව මූලික විමර්ශණයක් ආරම්භ කර ඇත. 2024.05.08 දින සිට එනම් අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අදාල පැමිණිල්ල ලැබුණු දින සිට 2024.06.19 දින එනම් අධිකරණ අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව ප්‍රකාශය කරන දින වන විට ගතව ඇති කාලය වැඩ කරන දින 27 ක් බව පෙන්වා දෙන අතර, එකී කාලය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් 09 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ඇතුළු විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් අදාල ස්ථානයට ගොස් ස්ථාන පරීක්ෂණයක්ද සිදු කර ඇත. මේ වන විට මහාධිකරණ විනිසුරුවරයෙකුගෙන්ද, ප්‍රශ්නගත මහේස්ත්‍රාත්වරයාද ඇතුළුව නිලධාරීන් 10 දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර අවසන් කර විමර්ශණයේ අවසන් අදියරයට පැමිණ ඇත. අදාල විදුලි සැර වැදීමේ සිද්ධිය සිදුව ඇත්තේ 2023.08.27 දින වන අතර,



තැ.පෙ. 573, අළුත් කඩේ, කොළඹ 12. த.பெ.இல. 573, புதுக்கடை, கொழும்பு 12. P.O. Box 573, Hulftsdorp, Colombo 12.
ලේකම් / செயலாளர் / Secretary (+94) 11 2321104 කාර්යාලය / அலுவலகம் / Office (+94) 11 2433119 / 2451159 (+94) 11 2446111 jscinformaion@jsc.gov.lk www.jsc.gov.lk

CamScanner

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ හා සැබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාවට පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ ඉන් දළ වශයෙන් මාස 08 කට වඩා වැඩි කාලයක් ඉකුත්ව ගිය පසුව වේ. සිද්ධිය සිදු වීමෙන් පසුව ගතව ඇති දීර්ඝ කාලය සලකා බලන කළ මේ පිළිබඳව පූර්ණ අපක්ෂපාතී විමර්ශනයක් සිදු කිරීම සඳහා යම්කිසි කාල සීමාවක් ගත වන බවත්, එවැනි පූර්ණ විමර්ශනයකින් අනාවරණය වන කරුණු මත පදනම්ව හැර විනිශ්වයකාරවරයෙකු විෂයෙහි විනය පියවර ගැනීම කිසිසේත්ම සුදුසු නොවන බවත් පෙන්වා දෙමි. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2024.05.08 දිනැති ලිපිය හා ඇමුණුම් මඟින් එම නිල නිවසේ සහ ගල්කිස්ස අධිකරණ සංකීර්ණයේ මාස කිහිපයක විදුලි සහ ජල පරිභෝජනය පිළිබඳ බිල්පත් ඉදිරිපත් කිරීමක් ද, ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ කිහිපයක්ද ඉදිරිපත් කිරීම පමණක් සිදු කර තිබූ බවත්, වෙනත් කිසිදු විශ්ලේෂණයක් හෝ ඉදිරිපත් කර නොතිබූ බවත්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරමින් පවතින විමර්ශණයේදී අදාල සියලු සාක්ෂි සටහන් කිරීම සහ විශ්ලේෂණය කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ විමර්ශණ නිලධාරීන් විසින් සිදු කරමින් පවතින බවත් ඔබතුමාගේ අවධානයට ලක් කරමි.

(II) කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ තිබෙන ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වේලාව පැය භාගයකින් අඩු කොට වංචනිකව සකස් කිරීම.

නිරීක්ෂණය : එකී කරුණ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2024.04.29 දින අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදුව, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ප්‍රථමයෙන් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව නියම කර ඇත. මේ වන විට එකී ප්‍රකාශය සටහන් කර අවසන් කර ඇති අතර, එකී ප්‍රකාශය මත පදනම්ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරි පියවර ගැනීමට නියමිතය.

(III) කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ 2022 මැද භාගයේ සිට 2024 දක්වා කාලය තුළ නඩු භාණ්ඩ කාමරයේ තිබූ රුපියල් කෝටි 20 ක් පමණ වටිනාකමින් යුතු යැයි කියනු ලබන විස්කි තොගයක් සොරකම් කිරීම.

නිරීක්ෂණය : කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ සිදුව ඇති නඩු භාණ්ඩ හා සබැඳි අක්‍රමිකතා, වංචනික ක්‍රියා පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි සලකා බලන ලදුව, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විමර්ශණවල ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ භාරකරුවන් ලෙස සේවය කරන ලද නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය අත්හිටුවීමට ක්‍රියා කරන ලදී. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ලෙස ප්‍රසන්න අල්විස් මහතා 2023.01.02 දින වැඩ බාර ගැනීමෙන් අනතුරුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ නිසි පරිදි ගණනය කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග සහ උපදෙස් මත එකී ප්‍රසන්න අල්විස් මහතා විසින් ආරම්භ කල අතර, (ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පවා අධිකරණ



CamScanner

සේවා කොමිෂන් සභාව විසින් අනුයුක්ත කරන ලදී.) එම ගනන් ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මෙම මත්පැන් බෝතල් විශාල ප්‍රමාණයක් නොමැතිවීම පිළිබඳව අනාවරණය විය. ඒ පිළිබඳව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට ලිඛිතව වාර්තා කරන ලදුව, එම කරුණ පිළිබඳව මූලික විමර්ශණයක් සිදු කරන ලෙසට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් 2023.11.16 දින නියම කර ඇත. තවද මේ හා සබැඳිව පැවැත්වෙන පොලිස් විමර්ශණවල ප්‍රගතියද අධ්‍යයනය කරමින් විමර්ශණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.

(IV) කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිඥවරුන් පිරිසක් විසින් ජනාධිපති ලේකම්වරයාට ඉදිරිපත් කර ඇති පැමිණිල්ල.

නිරීක්ෂණය : මේ හා සබැඳිව නිර්ණාමික පැමිණිල්ලක් ජනාධිපති අතිරේක ලේකම් චිත්‍රා තිලකරත්න මහත්මිය විසින් අංක PS/CSA/00/2/102 සහ 2024.06.13 දිනැති ලිපිය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත යොමු කර ඇති අතර, 2024.06.14 දින අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එය ලැබී ඇත. එකී පැමිණිල්ල ලද විගස අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් එහි අංක සඳහන් නඩු වාර්තා කිහිපයක පිටපත් ෆැක්ස් මගින් ගෙන්වා පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එකී කරුණු අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර, එකී පැමිණිල්ලේ සඳහන් සියළුම මුල් නඩු වාර්තා කැඳවා පරීක්ෂා කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මේ වන විටත් පියවර ගෙන ඇත.

(V) අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ නීති විරෝධි සහ අත්තනෝමතික ක්‍රියා කලාපය සබැඳිව යනුවෙන් සභාගත කර ඇති නිර්ණාමික පැමිණිල්ල.

නිරීක්ෂණ: (අ). වත්මන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා එම තනතුරට පත්ව ඇත්තේ 2018.01.02 දිනැතිවය. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ඒ මහතාගේ සේවා කාලය අද දින වන විට වසර 06 ½ ක් පමණ වේ. ඒ අනුව ඒ මහතා වසර 09 හා/හෝ 10 ක කාලයක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ බව ගෙන හැර දැක්වීම සත්‍යයෙන් තොර වේ.

(ආ). එම නිර්ණාමික පැමිණිල්ලේ සඳහන් ගල්කිස්ස දිසා විනිසුරු නිල නිවසට ගල්කිස්ස අධිකරණ සංකීර්ණයෙන් අනවසරයෙන් විදුලිය හා ජලය ලබා ගැනීම, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ ඇඟිලි සටහන් යන්ත්‍රයේ වේලාව පැය භාගයක් ආපස්සට කැරකවීම හා කොටුව මහේස්ත්‍රාත් විසින් චූදිතයන්ට අඩු දඩ මුදල් නියම කිරීම සහ ඔවුන් අධිකරණයේ යම්කිසි වේලාවක් දක්වා රඳවා ගෙන මුදා හැරීම යන කාරණා සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉහත (I), (II), (III) සහ (IV) හි දක්වා ඇත.



CamScanner

(ඈ). එකී නිර්ණාමික පැමිණිල්ලේ 03 සහ 04 ඡේදවල සඳහන් ගාල්ල මහේස්ත්‍රාත් ඉසුරු නෙත්තිකුමාර මහතාට එරෙහිව ලැබී ඇති පැමිණිලි සියල්ල අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අතර, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව ඉසුරු නෙත්තිකුමාර මහතා අධිකරණ සේවා කොමිෂන් සභාව හමුවට කැඳවා කරුණු විමසීමක්ද සිදු කර ඊට අනුෂංගීය තිසි පියවරද ගෙන ඇත.

(ඈ). එම නිර්ණාමික පෙත්සමෙ සඳහන් කෝසල සේනාධීර මහතා ඇල්පිටිය ප්‍රදේශයේ සේවය කර නිල නිවසින් නික්ම යාමේදී ලේඛනගත ගෘහ භාණ්ඩ වංචනික ලෙස ඉවත් කිරීමක් සම්බන්ධයෙන් මේ දක්වා අධිකරණ සේවා කොමිෂන් සභාවට කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති අතරම, අවම වශයෙන් කෝසල සේනාධීර මහතා ඇල්පිටිය දිසා විනිසුරු/ මහේස්ත්‍රාත් ලෙස සේවය කර ද නොමැත.

(ඉ). එම නිර්ණාමික පෙත්සමෙ 08 සිට 15 දක්වා ඡේදවල සඳහන් කරුණු පිළිබඳව නිරීක්ෂණ පහත පරිදි වේ.

(i). විදේශ අධ්‍යයන සංචාර සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව අධිකරණ නිලධාරීන් හා/හෝ මහාධිකරණ විනිශ්චයකාරවරුන් තෝරා ගනු ලබන්නේ අනෙකුත් කරුණු අතර එකී විදේශ අධ්‍යයන සංචාර ප්‍රදානය කරනු ලබන ආයතනවල නිර්ණායකද මත පදනම්ව වේ. තවද එලෙස තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විනා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නොවේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සිදු කරනුයේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි එලෙස තෝරා ගනු ලබන විනිශ්චයකාරවරුන්ට ඒ බව දන්වා යැවීමයි. තවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ වර්තමාන ලේකම් සංජීව සෝමරත්න මහතා ඔහුගේ සම්පූර්ණ ධූර කාලය තුළම කිසිදු විශේෂ විදේශ නිල සංචාරයකට සහභාගී වී නොමැති බව දන්වමි.

(ii). අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත ලැබෙන සියලුම පැමිණිලි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන අතර ඒවායේ සඳහන් කරුණු සලකා බලා ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

(iii). අධිකරණ නිලධාරීන්ට වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛයන්හි සඳහන්ව ඇති අතර, එකී චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණ නිලධාරීන්ට වැටුප් වර්ධක ලබා දීම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරයි. සියලු අධිකරණ නිලධාරීන්ගේ වැටුප් වර්ධක



CamScanner

අයදුම්පත්‍ර අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අදාල අධිකරණ නිලධාරීන්ට අදාල චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් වර්ධක ලබා දීම, නොදීම තීරණය කරනු ලබයි.

(iv). අධිකරණ නිලධාරීන් හෝ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විෂමාචාරී ක්‍රියා කලාපයන් සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත වාර්තා වූ පසුව අදාල විනිශ්චයකාරවරුන්ගේ රාජකාරී වැඩ තහනම් කළ යුතුද/නැතිද යන වග පිළිබඳවත්, එකී නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳවත් තීරණය කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසිනි. තවද මේ අවස්ථාව වන විට විෂමාචාරයන් සබැඳිව රාජකාරී වැඩ තහනමකට ලක්ව ඇත්තේ එක් මහාධිකරණ විනිශ්චයකාරවරයෙක් සහ එක් අධිකරණ නිලධාරියෙකු පමණක් බව ඔබගේ අවධානයට යොමු කරමි.

(v). බදු සහන වාහන ආනයන බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබන්නේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 පරිදි වේ. එහි සඳහන් කොන්දේසි සපුරා නොමැති නිලධාරීන්ට අදාල වාහන බලපත්‍ර ලබා දීම නිර්දේශ කරනු නොලබයි. උදාහරණ වශයෙන් පහත සඳහන් හේතු දැක්විය හැකිය.

(අ). නොනිමි විනය ක්‍රියාමාර්ග පවතින නිලධාරීන් (ඉහත සඳහන් චක්‍රලේඛයේ 2.5 වගන්තිය බලන්න.)

(ආ). රාජකාරී වැඩ තහනම් වීම ආදී කරුණු හේතුවෙන් නියමිත සක්‍රීය සේවා කාලය සපුරා නොමැති නිලධාරීන් (ඉහත සඳහන් චක්‍රලේඛයේ 3.4 වගන්තිය බලන්න)

(vi). අධිකරණ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රද ඇතුළුව සියලුම ස්ථාන මාරු ඉල්ලීම් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ. එකී ස්ථානමාරු ඉල්ලීම් සහ එකී ස්ථාන මාරුවීම් ලද පසු අධිකරණ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාද සලකා බලා සුදුසු පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ස්ථාන මාරුවීම් ලබා දීම සිදු කරනු ලබයි. එසේම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විනය හේතු මත හෝ සේවා අවශ්‍යතා මත පදනම්ව වාර්ෂික ස්ථාන මාරුවලට අතිරේකව ස්ථාන මාරු සිදු කරනු ලබන බවත් මෙහිලා සඳහන් කරමි.



CamScanner

(vii). අධිකරණ විනිසුරුවරුන් හා සබැඳිව කටයුතු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභා රීති මාලාවක් පවතින අතර, එකී රීතිවලින් ආවරණය නොවන කරුණු සබැඳිව දැනට බල පවත්නා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, එකී විධිවිධානයන්හි අන්තර්ගතව ඇති මූල ධර්මයන් මත පදනම්ව අවශ්‍ය පරිදි අදාල කර ගනිමින් පරිපාලන කටයුතු සිදු කරන බව පෙන්වා දෙමි. එසේම දැනටමත් පිළිගත් නිර්ණායකයන් හා මූල ධර්මයන් මත පදනම්ව සකසන ලද උපලේඛනගත රජයේ නිලධරයන් සඳහා වන සේවා ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක වන බව දන්වමි. වසර 36 ක් තරම් පැරණි යල් පැන ගිය සේවා ව්‍යවස්ථාව වෙනුවට පෙර සඳහන් කළ නව සේවා ව්‍යවස්ථාව සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන ලද්දේ වත්මන් ලේකම්වරයාගේ ධූර කාලය තුළදී බව වැඩිදුරටත් පෙන්වා දෙමි.

(viii). ඉහතින් විග්‍රහ කරන ලද සියලුම කරුණු අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ වත්මන් ලේකම්වරයා ඔහුගේ ධූරයේ බලතල අව භාවිතා කළ බවක්, එකී ධූරයේ බලතල භාවිතා කරමින් අත්තනෝමතිකව කටයුතු කළ බවක්, එකී ධූරයේ බලතල යොදා ගෙන යම් යම් විනිශ්වයකාරවරුන් විෂයෙහි පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බවක් අනාවරණය වී නැත. එසේම වත්මන් ලේකම්වරයා ස්වකීය ධූරයේ කාර්යය සහ කර්තව්‍යයන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්, නියමයන් සහ නියෝගයන්ට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි සිදු කරන ලද බවත්, ඔහුට අහිමි කිසිදු අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් අනීතිකව. නීති විරෝධීව හෝ නිත්‍යානුකූල නොවන අයුරින් භාවිතා කර ඇති බවක් කිසිදු අයුරකින් අනාවරණය වී නොමැති අතර, ඔහු කෙරෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවේ විශ්වාසය පවතින බවත් දැනුම් දෙමි.

02. ඉහත සඳහන් කරුණුවලට අගති විරහිතව පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

(I) අධිකරණ අමාත්‍යවරයා ඔහුට ලද තොරතුරු මත පදනම්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියා කලාපය පිළිබඳව විවේචනයක් සිදු කිරීමට ප්‍රථමව අවම වශයෙන් එකී කරුණු සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාව විමසා ඒ පිළිබඳව තහවුරු කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නැත. අධිකරණ සේවා සංගමය මාධ්‍ය නිවේදනයක් නිකුත් කර ඇත්තේ අධිකරණ සේවා සංගමයේ නිල කටයුත්තක් පදනම් කර ගනිමිනි. තවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 328 හි 02 ඡේදයේ සඳහන් වන්නේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යන්හි පෙනී සිට ප්‍රකාශ නිකුත් කිරීම මඟින් අධිකරණයේ ස්වාධීනත්වයට හා ගෞරවයට හානි සිදු වන්නේ නම් එවැනි ක්‍රියාවලින් වැළකිය යුතු බව පමණි.



CamScanner

03. 2017 වර්ෂයේ අගභාගයේ සිට මේ දක්වාම අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වනු ලබන්නේ බහාලුම් පෙට්ටිවලින් සමන්විත තාවකාලික පරිශ්‍රයක් තුල වේ. එම තාවකාලික පරිශ්‍රයේ ඉඩකඩ සීමාවීම හේතුවෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවට අනුයුක්තව සිටිය යුතු තත්‍ය කාර්ය මණ්ඩලය අනුයුක්ත කරගනිමින් සේවා සැපයීමට නොහැකිව ඇත. දැනට එහි සේවය කරනු ලබන්නේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% කට මදක් වැඩි ප්‍රමාණයකි. විශේෂයෙන්ම අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විමර්ශණ අංශයේ කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ විමර්ශණ නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබා ගනිමිනි. එයින්ද එක් නිලධාරියෙකුට වැටුප් රහිත නිවාඩු අනුමතව ඇත. විමර්ශණ පවත්වන අවස්ථාවකදී පුද්ගලයෙකුගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට තරම්වත් සුදුසු ස්ථානයක් වර්තමාන අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයෙහි නොමැති අතර, එවැනි අවම පහසුකම් මධ්‍යයේ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් විමර්ශණ කටයුතු සිදු කරන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ස්ථිර ගොඩනැගිල්ල වසර 06 කට අධික කාලයක් තිස්සේ අළුත්වැඩියා කර ලබාදීමට මෙතෙක් අදාල බලධාරීන් කටයුතු කර නැත. අධිකරණ පද්ධතිය මනාව පවත්වා ගෙන යාම සඳහා අධිකරණ කාර්ය මණ්ඩලවල දැනට පවතින 1500 කට ආසන්න පුරප්පාඩු ප්‍රමාණයද, 2024/2025 වර්ෂ සඳහා අලුතින් අධිකරණ නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමටද ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත්, මේ වන තෙක් ඒ සඳහා නිසි මූල්‍ය ප්‍රතිපාදන හෝ අනුමැතියක් ලැබී නැත. ඉහතින් දක්වන ලද කරුණු හේතුවෙන් සමස්ථ අධිකරණ පද්ධතිය නිසි ලෙස පරිපාලනය කරමින් කළමනාකරණය කර ගැනීම බරපතල අභියෝගයක් වී ඇත.

04. යොමුගත (ඇ) දරණ පැමිණිල්ලේ 05 පිටුවේ දෙවන ඡේදය මගින් අධිකරණ අමාත්‍යවරයා සිය පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ 1953 අංක 21 දරණ පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 03 වන වගන්තිය අනුව පුළුල් අර්ථයෙන් ගත් කල පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සහ අවසන් වශයෙන් ශ්‍රී ලංකාවේ සමස්ථ ජනතාවගේ වරප්‍රසාද උල්ලංඝනය වීමක් සිදුව ඇති බවකි. එනිසා අධිකරණ සේවා කොමිෂන් සභාවේ මෙම ලිපියේ සඳහන් කරුණු සම්පූර්ණයෙන්ම ඔබතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, මෙම ලිපියේ පිටපත් පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂ නායකයින්ගේ පරිශීලනයට ලබා දෙන ලෙසත් මෙම ලිපිය හැන්සාඩ් ගත කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රවිනිශ්චයකාර,
සභාපති, අධිකරණ සේවා කොමිෂන් සභාව.

ජනාධිපති නීතිඥ විජිත් කේ. මලල්ගොඩ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර,
සාමාජික, අධිකරණ සේවා කොමිෂන් සභාව.

ඊ.ඒ.ජී.ආර්. අමරසේකර,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර,
සාමාජික, අධිකරණ සේවා කොමිෂන් සභාව.

2024.06.26



CS CamScanner